12

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 පුනර් පරීක්ෂණය - 2019 දෙසැම්බර්/2020 ජනවාරි
Bachelor of Arts General (External) Degree Part II Repeat Examination 2015 – Dec. 2019/Janu. 2020

සවිසා 3.1 - සංවර්ධන සමාජ විද්‍යාව
SGYG 3.1 - Sociology of Development

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

---

01. (අ) සංවර්ධනය යන සංකල්පය නිර්වචනය කරන්න.
(ලකුණු 10)

(ආ) දුගීකම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

02. (අ) සංවර්ධනය පිළිබඳ නවීකරණ න්‍යායයෙහි මූලික උපකල්පන විභාග කරන්න.
(ලකුණු 10)

(ආ) එම න්‍යායට එරෙහිව ඉදිරිපත්ව පවතින විවේචන පැහැදිලි කරන්න.
(ලකුණු 10)

03. (අ) පරාධීන න්‍යායයෙහි කේන්ද්‍රීය ලක්ෂණ විස්තර කරන්න.
(ලකුණු 10)

(ආ) පරාධීන න්‍යාය හා සම්බන්ධ සීමාකම් පරීක්ෂා කරන්න.
(ලකුණු 10)

04. (අ) ග්‍රාමීය සංවර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

(ආ) සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය විවේචනාත්මකව අගයන්න.
(ලකුණු 15)

05. බටහිර නොවන සමාජයන්හි කෘෂි කර්මාන්තය නවීකරණය සඳහා බටහිර ආකෘතිය වූ හරිත විප්ලවීය අත්දැකීම් භාවිතා කිරීම පිළිබඳ විවේචනාත්මකව සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

06. "වර්තමාන සංවර්ධන ක්‍රියාවලියෙහි තෙවන පාර්ශවයක් ලෙස රාජ්‍ය නොවන සංවිධාන සුවිශේෂී වූ භූමිකාවක් හිමිකර ගනියි" ඔබේ අදහස් දක්වන්න.
(ලකුණු 10)

07. ශ්‍රී ලංකා සමාජයේ දිළිඳුකම පිටුදැකීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධාන රාජ්‍ය ව්‍යාපෘතියක් වන සමෘද්ධි වැඩසටහන පිළිබඳ සාධනාත්මක හා නිශේධනාත්මක ලක්ෂණ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා <u>දෙකක්</u> පිළිබඳව සටහන් ලියන්න.

(එක් සටහනකට ලකුණු 10 කි)

(අ) දුගීකමේ සංස්කෘතිය

(ආ) ප්‍රජා සංවර්ධනය

(ඇ) ඩබ්ලිව්. ඩබ්ලිව්. රොස්ටොව් හා නවීකරණ න්‍යාය

(ඈ) තිරසාර සංවර්ධනය